# මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2013.

ත්‍රිපිටක ධර්මය

1 වසර　　　　　　　　　　　　　　　　　　　　　　　　　　　　　　　　කාලය පැ 2 යි.

---

01. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

I. බෝසතාණන් වහන්සේ අනාගතයේ දී ගෞතම නමින් බුදු වන බවට පළමුවෙන් ම නියත විවරණ ලැබුවේ කුමන බුදුරජාණන් වහන්සේගෙන් ද ?

II. සිදුහත් කුමරු ශිල්ප ඉගෙන ගත්තේ කුමන බමුණාගෙන් ද?

III. ''පවත්තඵල භෝජී වීම'' යන්නේ තේරුම ලියන්න.

IV. පැවිද්දා විසින් නිතර සිහි කල යුතු කරුණු ඇතුලත් සූත්‍රය කුමක් ද ?

V. 'සුගත' යන බුදු ගුණය හඳුන්වන්න.

VI. විශාඛා උපාසිකාවට තම දෙමාපියන්ගෙන් ලැබුණ වටිනා ආභරණය කුමන නමකින් හඳුන්වන්නේ ද?

VII. මෙත්තානිසංස සූත්‍රයට අනුව මෛත්‍රිය වැඩීමෙන් ලැබෙන ආනිසංස ගණන කීයද?

VIII. සිදුහත් බෝසතාණන් අභිනිෂ්ක්‍රමණය කළේ අවුරුදු කීයේදී ද?

IX. සිදුහත් කුමරුට නම් තැබීමේ උත්සවයට බමුණන් කීදෙනක් කැඳවන ලද්දේ ද?

X. අසිත තවුසා සිදුහත් කුමරුට වැඳීමට හේතුව කුමක් ද?

XI. ධම්මො හවේ රක්ඛති ධම්මචාරී යන්නෙහි අදහස ලියන්න.

XII. සේඛියා කීයක් තිබේ ද ?

XIII. ධම්ම පදයේ වග්ග කීයද ?

XIV. මට්ටකුණ්ඩලීගේ පියාගේ නම කුමක් ද?

XV. ඉරියව් හතර නම් කරන්න.

XVI. තච පඤ්චකය ලියන්න.

XVII. චුල්ලපන්ථක පොඩි හාමුදුරුවන්ට භාවනා කිරීමට දුන් පාඨය ලියන්න.

XVIII. අශෝක රජතුමාගේ පියාගේ නම කුමක් ද ?

XIX. යශෝධරා දේවියගේ සොහොයුරා කවුරුන් ද ?

XX. බෞද්ධයාගේ අත්පොත යයි කියනුයේ කිනම් පොතකට ද ?

(ලකුණු 2 x 20 = 40)

02. පහත සඳහන් ගාථා සම්පූර්ණ කර ලියන්න.

I. වන්දාමි චේතියං සබ්බං ..........................

II. සණ්සාරප්ප දිත්තෙන ............................

III. වණ්ණ ගන්ධ ගුණෝපෙතං........................ (ලකුණු 5 x 3 = 15)

03. I. තිත්තිර ජාතකය දේශනා කලේ කාට ද ?

II. එහි එන සත්තු තිදෙනා කවුරුන් ද ?

III. ඔවුන්ගේ වයස සෙව්වේ කෙසේ ද ? (ලකුණු 4 + 4 + 7 = 15)

04. I. විශාඛාවගේ පියාගේ නම කුමක් ද ?

II. විශාඛාවට කියන තවත් නමක් ලියන්න.

III. පියා ඇයට දුන් අවවාද දහයෙන් හතරක් ලියන්න. (ලකුණු 4 + 4 + 7 = 15)

05. I. මෙහෙණි සස්න ආරම්භ කිරීමට මුල් වූ තෙරණිය කවුද ?

II. කාන්තාවන්ට පැවිදි උපසම්පදාව සඳහා පැනවූ ශික්ෂා පද අට හඳුන්වන නම ලියන්න.

III. ඒ විශේෂ ශික්ෂා පද අටෙන් දෙකක් ලියන්න. (ලකුණු 4 + 4 + 7 = 15)

The National e-learning Portal for The General Education